# ජාතික රාජ්‍ය සභාවේ
# 1973 අංක 8 දරන අල්ලස් (විශේෂ අධිකරණ බල) පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 මාර්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 8 දරන අල්ලස් (විශේෂ අධිකරණ බල) පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 10 වන දින]

එල්.ඩී.—ඕ. 3/73.

**අල්ලස් පනත යටතේ නඩු විභාග කිරීමේ අධිකරණ බලය නිශ්චිත අධිකරණයක් හෝ අධිකරණ වෙත සතු කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 8 දරන අල්ලස් (විශේෂ අධිකරණ බල) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. අල්ලස් පනත යටතේ වූ වරදවල් පිළිබඳ නඩු විභාග කර අවසන් කිරීමේ කාර්ය සඳහා, ඒ වරදවල් සිදු කරනු ලැබූ ස්ථානය කවර ස්ථානයක් වුව ද අධිකරණ අමාත්‍යවරයා විසින් අවස්ථානුකූල යයි සලකන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක මාර්ගයෙන් ශ්‍රී ලංකාව තුළ ඕනෑම ස්ථානයක පිහිටි උචිත අධිකරණයක් හෝ අධිකරණ නම් කළ හැකි ය. අල්ලස් නඩු සඳහා අමාත්‍යවරයා විසින් අධිකරණ නම කිරීම.

3. අල්ලස් පනත යටතේ වූ වරදවල් පිළිබඳව නඩු විභාග කර අවසන් කිරීම සඳහා, 2 වන වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණ අමාත්‍යවරයා අධිකරණයක් හෝ අධිකරණ නම් කරන අවස්ථාවක, අන් කිසි නීතියක කුමක් සඳහන් වුව ද ඒ අධිකරණයට හෝ අධිකරණවලට ඒ සියලු නඩු විභාග කිරීමේ, නිශ්චය කිරීමේ හා අවසන් කිරීමේ ද නීතියෙන් සලසා ඇති යම් දණ්ඩනයන් නියම කිරීමේ ද අධිකරණ බලය තිබෙන්නේ ය. නම් කරනු ලැබූ අධිකරණවල අධිකරණ බලය.

4. අධිකරණ අමාත්‍යවරයා විසින් 2 වන වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණයක් හෝ අධිකරණ නම් කරමින් නියමයක් කරනු ලැබූ අවස්ථාවක, අල්ලස් පනත යටතේ පවරනු ලැබ අන් කිසි අධිකරණයක විභාගයට භාජනව පවත්නා හා සාක්ෂි සටහන් කර ගනු නොලැබූ යම් නඩුවක්, අමාත්‍යවරයාගේ නියමය පරිදි, එසේ නම් කරනු ලැබූ යම් අධිකරණයකට මාරු කරනු ලැබිය හැකි ය. නඩු මාරු කිරීම.

5. මෙම පනතෙහි "උචිත අධිකරණය" යන්නෙන් දිසා අධිකරණයක් අදහස් වන අතර එයට යම් අතිරේක දිසා අධිකරණයක් ද ඇතුළත් වේ. අර්ථ නිරූපණය.

ණේ 20215—9,761 (73/3)

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.